**විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ පියවර II, අදියර I - 2013**

--------------------------------------------------------------------------

විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ පියවර II , අදියර I හි 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, වර්තමානයේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය (ජා.ස.ජ.නි.) ලෙස හඳුන්වනු ලබන ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (ජා.ස.ජ.බැ.) සහ ශ්‍රී ලංකා රජය අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 90 දරන ණය ගිවිසුම හා ශ්‍රී ලංකා රජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 සැප්තැම්බර් 3 දින එළඹි අංක එස්එල්-පී 90 දරන අතුරු ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර සහ තදාසන්න නගර ප්‍රදේශ වල ජල සැපයුම් සේවා මට්ටම ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති ඇස්තමේන්තු පිරිවැයට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 4,164 කට සමාන ජපන් යෙන් මිලියන 4,664 ක් වූ අතර ඉන් රු. මිලියන 3,078 කට සමාන ජපන් යෙන් මිලියන 3,447 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන බැංකුව විසින් ලබා දීමට එකඟ වී ඇත. පසුව, අතිරේක වැඩ හා මිල උච්චාවචනයන් හේතුවෙන් පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 7,146 කට සමාන ජපන් යෙන් මිලියන 5,497 ක් දක්වා සංශෝධනය කර තිබුණි. ඉන් රු.මිලියන 6,024 කට සමාන ජපන් යෙන් මිලියන 4,634 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2007 මාර්තු 30 දින ආරම්භ කළ අතර 2012 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට නියමිත විය. තවද, ව්‍යාපෘති කාලය 2015 ජුනි 20 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන

සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද බව,

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැටළු වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති නිලධාරීන් සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවන ලද රු. මිලියන 1.3 ක් වූ පාරිශ්‍රමික ව්‍යාපෘති ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) මහනුවර ජල සම්පාදන ව්‍යාපෘති අදියර-I පියවර-I නැමැති වෙනත් ව්‍යාපෘතියක කොන්ත්‍රාත්කරුවකු වෙත ව්‍යාපෘතිය විසින් ගෙවන ලද රු. මිලියන 1,030.9 ක් මෙම ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි.

**2.2.2 නොසැසඳු ශේෂ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය තුළදී ලද ණය අරමුදල් ලෙස දක්වා ඇති රු. මිලියන 787.83 ක් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යන සටහන් අනුව දක්වා ඇති රු. මිලියන 717.90 ක අරමුදල් සමඟ නොසැසඳුනි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 4,674.36 ක් වූ ණය අරමුදල් ලැබී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 5,819.99 ක් වූ ණය අරමුදල් පමණක් එදිනට ලැබී තිබුණි. වෙනස සසඳා ඒ අනුව ලෙජර ශේෂ ගැලපීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

## 2.2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කළ ස්ථාවර වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට ව්‍යාපෘතිය විසින් විස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) 2010 ජූලි 26 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 05 හි අවශ්‍යතාවයන්ට අනුව ව්‍යාපෘතියේ ගණුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

(ඇ) ණය ගිවිසුමේ උපලේඛන 2 ට අනුව, සාමාන්‍ය පරිපාලන වියදම් හා වෙනත් චක්‍ර පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා හිමිකම් නොලබයි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුවන්ගේ බිල් මත රු. මිලියන 4.5 ක් වූ සාමාන්‍ය පරිපාලන වියදම් ව්‍යාපෘතිය ඇතුළත් කර ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලීම් කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.12 ඡේදය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය හා 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) හී 05 ඡේදය ප්‍රකාරව, එකතු කළ අගය මත බදු ගෙවීම් මත මාසික වාර්තාවක් විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2013 දී ගෙවන ලද එකතු කළ අගය මත මුළු බදු වටිනාකම රු. මිලියන 62.80 ක් විය.

(ඉ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු. මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් බාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩර පිරිනැමීමෙන් පසු ටෙන්ඩර් ගිවිසුම දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල නියුතු කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි. තවද, මෙම අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්කරුවන් සමඟ ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි.

# 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම. | අරමුදල් උපයෝජනය සමාලෝචිත වර්ෂය තුළ | | 2013 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජ.යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජ.යෙන් මිලියන | රු. මිලියන | ජ.යෙන් මිලියන | රු. මිලියන |
| ජා.ස.ජ.නි. | 4,634.00 | 6,024.00 | 718.00 | 609.50 | 787.80 | 3,530.81 | 4,769.70 |
| ශ්‍රී.ලං.ර | 863.00 | 1,122.00 | 200.00 | 128.43 | 169.53 | 743.14 | 980.95 |
| | 5,497.00 | 7,146.00 | 918.00 | 737.93 | 957.33 | 4,273.95 | 5,750.65 |

ඉහත තොරතුරු අනුව, වසර 08 ක මුළු ව්‍යාපෘති මෙහෙයුම් කාලපරිච්ඡේදයෙන් 2013 දෙසැම්බර් 31 දිනට වසර 6 ½ ක් සම්පූර්ණ කිරීමෙන් පසුවද ව්‍යාපෘතිය සියයට 76 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ළඟාකරගෙන තිබුණි. එමනිසා ඉතිරි වසර 1 ½ ව්‍යාපෘති මෙහෙයුම් කාල පරිච්ඡේදය තුළදී ජපන් යෙන් මිලියන 1,103 ක ණය අරමුදල් උපයෝජනය සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් මත කඩිනම් වැඩ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

**3.2 භෞතික ප්‍රගතිය**

-----------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කළ ප්‍රගති වාර්තා අනුව, සේවා ජලාශ හා පොම්පාගාර ඉදිකිරීම හා සැපයීම හා ජල නල සම්ප්‍රේෂණ ස්ථාපනය කිරීම එළීම හා බෙදා හැරීමේ කටයුතු 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් පරිදි සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත් ගෝනිගොඩ පොම්පාගාරය හා මැදවෙල සේවා ජලාශය ඉදිකිරීම හා මැදවෙල හා කෝපිවත්ත බෙදාහැරීමේ ජල නල එළීම සමාලෝචිත වර්ෂය තුළදී අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

**3.3 ඉඩම් අත්පත් කර ගැනීම**

-------------------------

හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යටිටාව ප්‍රදේශයේ පොම්පාගාරයක් ඉදිකිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉඩම් කැබලි 06 ක් ව්‍යාපෘතිය අත්පත්කරගෙන තිබුණු අතර ඒ සඳහා 2013 දෙසැම්බර් මාසයේදී රු. මිලියන 6.3 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් රු. 607,309 ක් වූ ප්‍රමාද ගාස්තු හා බදු මුදල් නොගෙවීම හේතුවෙන් ඉඩම් වල හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත මාරු කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

-----------------------------

පරිචයක් ලෙස, ව්‍යාපෘති සේවක පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබුණද වැටුප් පිරිවැයෙන් සියයට 20 ක් පොදුකාර්යය වියදම් ලෙස ව්‍යාපෘතියෙන් අය කරයි. සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ව්‍යාපෘතිය විසින් එසේ ගෙවන ලද පොදුකාර්ය වියදම රු. මිලියන 6.9 ක් විය.